# ප්‍රතිභා

## අපූර්ව වස්ත්‍ර නිර්මාණයන්හි කුසලතාවය ප්‍රතිභාව

7 වන කාණ්ඩය - 1 වන කලාපය 2000 දෙසැම්බර්



SRI LANKA GERMAN TECHNICAL TRAINING INSTITUTE OLD BOYS' ASSOCIATION OF AUSTRALIA INC.

ප්‍රතිභා

## අම්මා

තිඹිරි ගෙදර සිට
මේ මහ එන්නට මට මඟ
පෙන්නු නිම්මා...

ලොව ඇති සොඳුරුම
වදන් හදින් ගෙන
මා හද සැනසූ ඔබ
අම්මා...

තොටිලි වැටෙන් පැන
නැගී සිටින ලෙස
ලේ කිරි කර දුන්නේ නුඹමයි
අම්මා...

ලොවම කලකිරි මා හද හැඩූ කල
මා හද සැනසූ
ලොවේ සොඳුරු ලඳ
අම්මා

ඉඳි වැට ලඟ හිඳ
මා ගෙට එනතුරු බලා සිටින්නට
ඔබ අද මෙහි නැත
අම්මා...

එනමුදු හද රැඳි
නොමැකෙන සිතුවම ඒ නොවේදෝ
මගේ අම්මා

රේණුකා වීරසිංහ

## රට ගිය පුතුන්

තල මුං කුරක්කන් සරුවට වවනවද
ඌරන් වැලි මුවන් සාවුන් කපනවද
කරල් පුදින්න මල් වැහි වහිනවද
හේනේ පැලේ නුඹ මසුරන් ගනිනවද

සරුවට වැඩුණු මුත් කජු පැල අඹ ආදී
අලි මී හරක් ගෙවැදී වනසා ලද්දී
අප්පා තනිවෙලා හේනේ වෙහෙසෙද්දී
කෙලෙසින් කවි ලියම් ඕවිල්ලක පැද්දී

තනිකම පාළුවට මගෙ කවි කියවන්න
භාවෝ මුවෝ මී මින්නෝ නිදියන්න
ගයනා තාලයට කුරහන් පුදින්න
ලහදි පැලට එම් මුං කිරිබත් කන්න

උපාලි ගුණරත්න

## ජීවිතයෙන්.....

තමාට වඩා ඉහළ අයට ආචාරශීලි වීම යුතුකමකි. තමා හා සමාන අයට ආචාරශීලි වීම හොඳ සිරිතකි. තමාට වඩා පහත් අයට ආචාරශීලි වීම උතුම් ගුණයකි.



# සිතුවිලි

ලැබුණා මෙමට ලිපියක් පිලිතුරු ලියලා
දමලා තිබුන අයදුම සලකා බලලා
තිබුණා එහි "අන්සක්සස්පුල්" කියලා
හදවත හඬා වැටුනා මා දුක දැකලා

තිබුනා එහි අපිට හොඳ කාලයක් එදා
සිටියා සහෝදරයින් මෙන් එදින සොදා
කරලා රට දැයට හැකි ලෙස වෙහෙස යොදා
ආවා මෙරට සැප සම්පත් සිතෙහි මවා

එම්බා සකල ජනයිනි මෙල්බන් වාසි
අසලා මසිත වද දෙන මේ පැන රාසි
හැම දින දමන අයදුම්පත් වෙයි විසි
කිම උන් නොදන්නේ අප පරතෙර බෝසී

"ඇක්ස්පිරියන්ස්" "අන්සක්සස්" යන වචනා
හිස මත වදින හෙණ කුළු ගෙඩි පහර මෙනා
ඉවසා වදාරා එන හැම පැන සොදනා
දමනෙමි ඇප්ලිකේෂන් රැකියා වෙතිනා

අවුරුදු දෙකක් ගෙවුනා සිත නොම දන්නා
ලැබෙනා වැඩක් කරමින් දින සති ගෙවුනා
මිතුරන් නිතර හමුවුවත් තතු සොයනා
අග හිඟ නම් දැනුනේ නෑ කිසි කලෙකා

නිදියහනෙදි සිහිනෙන් මව් රට යන්නේ
ලක්සෙට කොඩිය යයි සිහිනෙන් දොඩවන්නේ
"වී ලයින්" එකේ හඩිනුයි මා පිබිදෙන්නේ
නෑ හිතවතුන් මෙහි වගතුග විමසන්නේ

කවදද අනේ අපි ලංකාවට යන්නේ
නින්දෙදි තමයි එපැනට පිලිතුරු දෙන්නේ
බිරිඳ අසයි නිතරම මේ පැන සොඳිනේ
බලගිරි දෝසේ දෙන පිළිතුර මම දෙන්නේ

ලැබුණා පෝර්මයක් සුදු නිල් පැහැ ගත්ත
එය පිරවුවොත් හැකිවෙයි පුරවැසි මෙපුර
එලෙසම නොමැති වෙයි පුරවැසි අප ශ්‍රී පුර
කල් මැරුවෙමි සිතමින් සති මස් වසර

රැකියා නොමැති පුරවැසිකම් මොටද මට
රැකියා ලැබෙද්දී මා හට වේවි හැට
මා නම් නොදන්නෙමි යෙදුමට දහං ගැට
මා යන්නෙමි පෙරලා මගෙ මව් රටට



**1997 (S.C.A.T.S) සංවත්සරික විවෘත ඕස්ට්‍රේලියා සිංහල පද්‍ය රචනා තරඟාවලියේ 2 වන ස්ථානය දිනාගත් කවි පෙළ.**

**නිමැවුම අජිත් ද සිල්වා**

# පුංචි හපන්නු


a very windy day




Amandi Munasighe
prep
5 years old.
Sun
Mum
Dad
me
dog


කන්ද උඩ මගේ ගෙදර
හංසනා වීරසිංහ

# පුංචි හපන්නු








